Department of Education,Sabaragamuwa Province/ Weekly School



විෂයය:- පෙරදිග සංගීතය

ජූලි සතිය:- 01

ශ්‍රේණිය :- 10

Prepared by- Ravi Kurulugama
(Music Teacher:- Ke/Dehi/Waharaka M.M.V.

නිපුණතාවය 4.0 :- දේශිය සංගීතය පිලිබඳව ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික අරුමය රැක ගනියිග

නිපුනතා මට්ටම 4.0:- :- සිංහල පද්‍ය ගායනාවෙහි ස්වභාවය හඳුනා ගනිමන් ගායනා කරයි

- ❖ සේගී පිලිබඳ විශේෂ ලක්ෂණ
  - ○ භාෂාව පිළිබඳව හා සාහිත්‍ය පලිබඳව හසළ දැනුමක් ඇති උගතුන් විසින් රචනා කිරීම
  - ○ රචනා වූ සේගී පොත්පත්වල පොත් පත් වල ලියා තිබීම
  - ○ උපමා, අපමේය, ශබ්ද අලංකරණ, එළිවැට හා අනුප්‍රාසය වැනි කොටස් ඇතුලත්කර රචනා කර තිබීම
  - ○ සිංහල භාෂාවය අමතරව පාලි සංස්කෘත තෙලිගු ද්‍රවිඩ වැනි භාෂා සේගී සඳහා මිශ්‍ර වී තිබීම
  - ○ පොදු ජනතාවට රස විදීමට අපහසු වන අතර උගත් බුද්ධිමතුන් අරමුණු කරගෙන නිර්මාණය වීම

- ❖ සැළලිහිණි සංදේශයේ කවි
  - ○ මෙම ගීත සේගී අතරට අයත්වන අතර එහි එන්
    ''පැහැසරණිය මිණි පැමිණිය'' කවිය සමුද්‍රඝෝෂ විරිත අනුව ගායනා කරයි

  - ○ සමුද්‍රඝෝෂ විරිත යනු :- මුහුදේ රළ නැගෙන, බසිනආකාරය මෙන්ම වෙරළෙහි රළ හැපෙන ආකාරය සිහියට නැගෙන ආකාරයට විරිත නිර්මාණය වී තිබේ . මේ හේතුව නිසා මෙම විරිත සමුද්‍රඝෝෂ විරිත ලෙස හඳුන්වයි.

සැළලිහිණි සන්දේශය

කර්තෘ - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

සැළලිහිණි සන්දේශයේ එන පද්‍ය ගී විරිතින්, දසපද සැහැල්ලකින් හා සමුද්‍රඝෝෂ විරිතින් රචනා කර ඇත. උපමා, උපමේය, ආදි අර්ථාලංකාර එළිවැට, අනුප්‍රාස ආදි ශබ්දාලංකාර ද ඇතුළත් කොට කවි රචනා කර ඇත.

සමුද්‍රඝෝෂ විරිතට ගයන පද්‍ය කිහිපයක් පහත සඳහන් වේ.

පැහැසරණිය මිණිපැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නොව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැලණිය පුරවරට

ලකළ පුළුලුකුළැ බඳ මිණි මෙවුල්ලා
සමග රන් සලඹ රැව් දී මෙවුල්ලා
වයන පදට තබමින් පද කමල්ලා
රඟන ළඳුන් බල රූසිරු සියල්ලා

සමුද්‍රඝෝෂ වෘත්තය - සැළලිහිණි සන්දේශය.

ප ස ස ස    රි රි ගරි සරි ග රි සනි - - - - -
පැ හැ ස ර    ණි s යs මි ණි පැ මි ණි ය s s s s s
ස ග රි ම    ග - - - රිස - - - සසසසමම පප
කොත් අග    ට s s s ss s s s බඳ කි කිණි sයs
ම ම ග රි    සනි - - -
ද ද ගිහි ණි ය s s s
ස ග රි ම    ග - - - රිස ස සගරි ස - - -
වි ම න් ව    ට s ss ss s sss s s s s

- • *ක්‍රියාකාරකම:-*

01- ඉහ කරුණු සටහන් පොතෙහි ලියා ගන්න
02- සැළලිහිණ සංදේශයේ කවි ශ්‍රවණය කරන්න
03- සැළලිහිණ සංදේශයේ කවි ගායණයට හුරු වන්න
04- ඉහත ගීතය නිවැරදිව වාදනය කිරීමට පුහුණුවන්න
05- සැළලිහිණි සංදේශයේ ඉහත කවිය සමුද්‍රඝෝෂ විරත අනුව ගායනයවීම අධ්‍යනය කරනන.

- ❖ අන්තරජාලයේ මේ සම්බන්ද ඇති පාඩම් වැඩිදුරට අධ්‍යනය කැන්න.

(ඒ සඳහා ඊ නැණපියස, ඊ තක්ෂලා, යූටියුබ්, වැනි වෙබ් අඩවි භාවිතා කළ හැකිය) ඔබට අවශ්‍ය ස්වර ප්‍රස්ථාර ලබා ගැනීමට “Music Lanka” APPS ඔබගේ ජංගම දුරකථනයට ඇතුළු කර ගන්න.